දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )


සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) MH/TA/09/PHA/APP/09/2024
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 2024.08. 28
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

රේඛීය අමාත්‍යාංශයට අයත් අදාල ආයතන ප්‍රධානීන්,

**ඖෂධවේදී නව පත්වීම් හා ස්ථාන මාරු - 2024**

අංක 2,086 හා 2018.08.31 දිනැති ගැසට් නිවේදනය හා 1973 හා 2016.06.24 දිනැති ගැසට් නිවේදනය අනුව වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවාවේ ඖෂධවේදී ඩිප්ලෝමා පාඨමාලාවට බඳවා ගෙන එම පුහුණුව සාර්ථකව අවසන් කර **2024.09.02** දින සිට පත්වීම් ලබන ඖෂධවේදී නිලධාරීන්ගේ නාම ලේඛනය ඇමුණුම I ලෙස මේ සමග අමුණා ඇති අතර, එම පත්වීම් **2024.09.02** දින සිට හෝ අදාල නිලධාරින් ඔබ ආයතනයේ සේවයට වාර්තා කරන දින සිට ක්‍රියාත්මක වේ.

02. 2024.09.02 දින සිට සති දෙකක් තුල සේවයට වාර්තා නොකරන නව පත්වීම් ලාභීන්ගෙන් ගිවිසුම් ප්‍රකාරව මුදල් අය කර ගැනීම සඳහා ඔවුන්ගේ තොරතුරු මා වෙත දන්වන්නේ නම් මැනවි.

03. නව පත්වීම් ලබා දීමට සමගාමීව ස්ථාන මාරු නියෝග ලබා දෙන ලද නිලධාරින්ගේ නාම ලේඛනය ඇමුණුම II ලෙස මේ සමග අමුණා ඇති අතර ස්ථාන මාරු සිදු කරන්නේ අදාල නිලධාරින්ගේ ඉල්ලීම මත බැවින්, ඒ සඳහා ගමන් වියදම් හෝ උපවේශන දීමනා හිමි නොවන බව දන්වමි. තවද ස්ථාන මාරු නියෝග මත නිලධාරීන් මුදා හැරීම යෝෂ්‍යතාවය මත සිදු කරන ලෙසත්, පළාත් සභා වෙත ස්ථාන මාරු ලබා ඇති නිලධාරීන්ගේ ස්ථාන මාරු අදාල පළාත් සභාවන්හි එකඟතාව ලද පසු ක්‍රියාත්මක කරන ලෙසද ඔවුන් සම්බන්ධයෙන් විනය කටයුතු වාර්තා වන්නේ නම් මුදාහැරීම සිදු නොකර අදාල තොරතුරු මා වෙත වාර්තා කරන ලෙසද වැඩිදුරටත් දන්වමි.

04. ඇමුණුම II හි සඳහන් ස්ථාන මාරු **2024.09.21** දිනෙන් පසුව ක්‍රියාත්මක කළ යුතුය.

05. මෙම ලිපියේ ඇමුණුම - I හා ඇමුණුම - II www.health.gov.lk සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය.

ජී.ඩබ්.සී. සුමේධා ප්‍රියභාෂිණී
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) III

අත්.කලේ/ කේ.එම්. වත්සලා ප්‍රියදර්ශණී
අතිරේක ලේකම් (පාලන) II

ජී. ඩබ්. සී. සුමේධා ප්‍රියභාෂිණී
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) III
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385,පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10.

- මෙම ලිපිය www.health.gov.lk සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය.

දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) MH/TA/09/PHA/APP/09/2024
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி ) 2024.08. 28
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

අදාල සියලුම ඖෂධවේදී නිලධාරීන් වෙත,

<u>ඖෂධවේදී ස්ථාන මාරු - 2023</u>

ඖෂධවේදී නව පත්වීම් සමඟ සිදුකරන ලද, ඇමුණුම II හි සඳහන් ස්ථාන මාරු අනුමත කර ඇති බව කාරුණිකව දන්වමි.

02. ඔබගේ ඉල්ලීම මත මෙම ස්ථාන මාරු ක්‍රියාත්මක වන බැවින්, මේ සඳහා ගමන් වියදම් හෝ උපවේශන දීමනා හිමි නොවේ. එමෙන්ම ලබා දී ඇති ස්ථාන මාරු සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම සිදු කළ නොහැකි බව ඔබගේ දැන ගැනීම පිණිස සඳහන් කර සිටින අතර, අනිවාර්යයෙන්ම ස්ථාන මාරු ලැබූ ස්ථානයේ සේවයට වාර්තා කළ යුතුය.

03. එමෙන්ම මධ්‍යම රාජ්‍ය සේවයේ සිට පළාත් සභා වෙත ස්ථාන මාරු ලබන සියළුම නිලධාරීන්ගේ ස්ථාන මාරු අදාල පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවන්හි එකඟතාව ලද පසු ක්‍රියාත්මක වන බව මෙයින් දන්වමි.

04. ඇමුණුම II හි සඳහන් ස්ථාන මාරු **2024.09.21** දිනෙන් පසුව ක්‍රියාත්මක වේ.

05. නව පත්වීම් හෝ ස්ථාන මාරු මඟින් ඔබ වෙත අනුප්‍රාප්තිකයන් ලබා දී ඇති බවත්, ඒ පිළිබඳව ඔබගේ ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇති බවත් වැඩිදුරටත් දන්වමි.

ජී.ඩබ්.සී. සුමේධා ප්‍රියභාෂිණී
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පාලන) III
ලේකම් වෙනුවට.

ජී. ඩබ්. සී. සුමේධා ප්‍රියභාෂිණී
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) III
සෞඛ්‍ය අමාත්‍යාංශය
'සුවසිරිපාය"
385,පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10.

සටහන - මෙම ලිපිය www.health.gov.lk සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් බාගත කළ හැකිය.